[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

09 ශ්‍රේණිය | විෂයය - ඉතිහාසය | පත්‍රය I/II | පැය - 02 යි.

නම ....................................................

### I කොටස

- I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාරදෙන්න.

**අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) මෙරටට පැමිණි පළමු ලන්දේසි ජාතිකයා වූයේ,
I) සිබෙල් ද වාර්ට් II) ජොරිස්වැන් ස්පිල්බර්ජන්
III) ජෝන්ෆයිබස් IV) ජෙරාඩ් හල්ෆ්ට්

02) "ඉගුරු දී මිරිස් ගත්තා වැනි ය". යන ප්‍රස්ථා පිරුළ හා සම්බන්ධ රජතුමා වන්නේ,
I) සෙනරත් රජුය II) පළමුවන විමලධර්මසූරිය රජු ය
III) දෙවන රාජසිංහ රජුය IV) පළමුවන රාජසිංහ රජුය

03) කුණ්ඩසාලේ කුමාරයා ලෙස ප්‍රකටව සිටියේ කවුරුන්ද?
I) දෙවන විමලධර්මසූරිය රජු II) දෙවන රාජසිංහ රජුය
III) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය IV) සෙනරත් රජුය

04) පහත සඳහන් බදු වර්ග අතරින් ක්‍රි.ව 1848 කැරැල්ලට අදාළ බදු වර්ග ඇතුළත් පිළිතුර තෝරන්න.
A මාළු බද්ද D වෙළෙඳ සැල් බද්ද
B ඇඟ බද්ද E කරත්ත බද්ද
C ලුණු බද්ද F දුම්කොළ බද්ද

I) BDE II) ACD
III) BCF IV) ABF

05) ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලය ඉදිකරන ලද මිෂනාරි සමාගම වන්නේ,
I) චර්ච් මිෂනාරි සමාගම II) ඇමරිකන් මිෂනාරි සමාගම
III) බැප්ටිස්ට් මිෂනාරි සමාගම IV) වෙස්ලියන් මිෂනාරි සමාගම

06) ඉන්දියානු සාගරයේ තම වෙළෙඳ බලය ගොඩනැගීමේදී ලන්දේසීන්ට සටන් කිරීමට සිදු වූයේ කුමන ජාතියක් සමග ද ?
I) පෘතුගීසි II) ඉංග්‍රීසි III) මුස්ලිම් IV) ඉන්දියානු

07) අපරාධ නඩු විසඳීම ප්‍රධාන කාර්යය වූ ලන්දේසීන් විසින් පිහිටුවන ලද ඉහළම උසාවිය කුමක්ද?
I) රාද් වැන් ජස්ටිට් II) සිවිල් රාද්
III) ලැන් රාද් IV) පිස්කල් උසාවි

08) ලන්දේසි පාලන සමයේ මෙරට සිදු කළ ආර්ථික වෙනස්කම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
A මහාබද්දේ දෙපාර්තමේන්තුව වෙනම කපිතාන්වරයෙකු යටතට පත්කර කාර්යක්ෂම කිරීම.
B පවුල්, ඉඩම්, පාසල් වශයෙන් තෝම්බු වර්ග තුනක් පිළියෙල කිරීම.
C ආගම් ප්‍රචාරය සඳහා ඉස්කෝල නම් ආයතන ආරම්භ කිරීම.
D මුතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම.

I) DCB II) ABC
III) ABD IV) ACD

09) දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් තිස්සමහාරාම වැව ප්‍රතිසංස්කරණය කල ආණ්ඩුකාරවරයා වන්නේ ,

I) හර්කියුලිස් රොබින්සන් II) විලියම් ග්‍රෙගරි
III) හෙන්රි වෝඩ් IV) ආතර් ගෝඩන්

10) ප්‍රංශවරු ඉන්දියාවේ පිහිටුවා ගත් බලකොටුවක් නොවන්නේ,

I) පොන්ඩිචේරි II) මද්‍රාසිය
III) කරිකාල් IV) චන්ද්‍ර නගර්

11) උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් කියවෙන්නේ කුමක්ද ?

I) බුද්ධාගම, දේවාගම කඩ නොකර පවත්වාගෙන යන බව
II) අංගඡේදනය වැනි දඬුවම් ක්‍රම අහෝසි කරන බව
III) උඩරට රදළ ප්‍රධානීන්ගේ තනතුරු හා අයිතිවාසිකම් ආරක්ෂා කරන බව
IV) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට ඔහුගේ ඥාතීන්ට උඩරට සිහසුන අහෝසි වන බව

12) A බෙල් මහතාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත් කිරීම
B උඩරට ප්‍රකාශනය මගින් බ්‍රිතාන්‍ය බලය තහවුරු කිරීම
C ඇහැලේපොළ ඇතුළු පිරිසක් මුරුසි දිවයිනට පිටුවහල් කිරීම
D යටත් විජිත භාර ලේකම් එමර්සන් ටෙනන්ට් එම තනතුරෙන් ඉවත් වීම
ඉහත ප්‍රතිඵලවලින් ක්‍රි.ව.1848 කැරැල්ලේ ප්‍රතිඵල පමණක් අඩංගු පිළිතුර වන්නේ,

I) A D II) B D III) A C IV) C B

13) උපකාරක ගිවිසුම් ක්‍රමය මඟින් ඉංග්‍රීසිහු ඉන්දියාවේ අල්ලාගත් ගත් ප්‍රදේශ දෙකක් තෝරන්න .

I) බොම්බාය හා හයිද්‍රාබාද් II) මයිසූර් හා හයිද්‍රාබාද්
III) ජායිපූර් හා හයිද්‍රාබාද් IV) නාග්පූර් හා හයිද්‍රාබාද්

**පහත දී ඇති ඉන්දියානු නිදහස් සටනේ නායකයන් ඇසුරින් 14, 15, 16,17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A) ඇනී බෙසන්ට්
B) බාල් ගංගාධාර් තිලක්
C) බිපින් චන්ද්‍රපාල්
D) ලාල් (ලජපත්) රායි
E) දඩබායි නඕරෝජි
F) මහත්මා ගාන්ධිතුමා
G) W.C. බෙනර්ජි

14) ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපති වූයේ කවුද?

I) A II) B III) E IV) G

15) ඉන්දියානු ජාතික සංගමය නියෝජනය කළ මධ්‍යස්ථ මතධාරීන් වන්නේ,

I) AD II) EG III) DF IV) AB

16) ඉන්දියානු ජාතික සංගමයේ සිටි අන්තවාදී නායකයන් වූයේ,

I) BCD II) CEF III) ABC IV) CDF

17) ස්වරාජ්‍ය සංකල්පය ඉන්දියාව තුළ ප්‍රචලිත කළ නායකයින් වූයේ,

I) AD II) FG III) CE IV) AB

18) ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණෙන විට එහි ශක්තිමත්ව පැවැති මූගල් අධිරාජ්‍යයේ පාලකයා කවුරුන්ද?

I) ඖරංසෙබ් II) ජහන්ගීර් III) සාජහන් IV) අක්බාර්

19) ක්‍රි.ව.1873 දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීමට පුරෝගාමී වූ භික්ෂූන් වහන්සේ කවුරුන්ද?

I) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි II) වාරියපොල ශ්‍රී සුමංගල හිමි
III) වස්කඩුවේ සුභූති හිමි IV) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි


20) කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවීමට පුරෝගාමී වූ වූ පුද්ගලයා කවුරුන්ද ?
I) පියදාස සිරිසේන මහතා
II) ඩී.බී ජයතිලක මහතා
III) අනගාරික ධර්මපාල තුමා
IV) ජෝන් ද සිල්වා මහතා

**(ලකුණු 2× 20 = 40)**

**II කොටස**

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ .
- අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01) දී ඇති ඉන්දියානු සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I) පෘතුගීසීන් ප්‍රථම වරට ගොඩබට වරාය දැක්වෙන අක්ෂරය.
II) පෘතුගීසීන්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය දැක්වෙන අක්ෂරය
III) ක්‍රි.ව.1761 දී ඉංග්‍රීසීන් විසින් ප්‍රංශවරු පරාජය කර අල්ලා ගත් ප්‍රදේශය දැක්වෙන අක්ෂරය
IV) ක්‍රි.ව.1668 දී ඉන්දියාවට පැමිණි ප්‍රංශ ජාතිකයින් විසින් වෙළෙඳ ගබඩාවක් ඉදිකළ වරාය දැක්වෙන අක්ෂරය ලියා දක්වන්න.
**(ලකුණු 4 × 2 = 8)**

II) දී ඇති රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.



A රූපයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.
B එතුමාගේ මූලිකත්වයෙන් අරඹන ලද සංවිධානය නම් කරන්න.
C එතුමා පැමිණියේ කුමන රටක සිට ද ?
D එතුමාගෙන් බෞද්ධ ජනතාවට සිදු වූ සේවාවක් ලියා දක්වන්න.
**(ලකුණු 4)**

III) සඳහන් සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.
A. යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම
B. වියළි කලාපයේ ගොවි ජනපද පිහිටු වීමේ පුරෝගාමී නායකයා
C. පංචමහා වාදවල දී මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේ
D. කොළඹ සහිරා විද්‍යාලය පිහිටු වූ ආගමික පුනර්ජීවන යුගයේ නායකයා

02)
I a) ශ්‍රී ලංකාවේ අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා නම් කරන්න.
b) උඩරට ගිවිසුම අත්සන් කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා කවුරුන්ද ? (ලකුණු 02)
II ක්‍රි. ව.1797 වර්ෂයේ දී මුහුදු බඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ලට හේතු වූ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)
III ක්‍රි.ව.1818 සටනට හේතු වූ කරුණු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03)

I) පංචමහා වාදවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II) බෞද්ධ පුනරුදය උදෙසා දේශීය නායකයන් ගත් ක්‍රියාමාර්ග හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

III) බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන නායකයින් දෙදෙනෙකු නම්කර ඔවුන්ගෙන් ඉටු වූ සේවාවන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 05)

04)

I) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට කිතු දහම ප්‍රචාරය කිරීම සඳහා පැමිණි මිෂනාරි සමාගම් දෙකක් ලියන්න. (ලකුණු 02)

II) මිෂනාරි සමාගම් තම ආගම ප්‍රචාරණය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

III) ඉංග්‍රීසින් කිතු දහම ප්‍රචාරයට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

05)

I) දේශීය කෘශිකර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

II) බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට වගා කරන ලද තේ වගාව දියුණුවට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

III) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ අරඹන ලද වතු වගාව නිසා ඇති වූ යහපත් ප්‍රතිඵලයක් හා අයහපත් ප්‍රතිඵලයක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

06)

I) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි වෙළෙඳ සමාගම යටතේ පැවති සමයේ ඇති වූ පහත සිද්ධීන් හා සම්බන්ධ නාමයන් ලියා දක්වන්න.

A . බදු අයකිරීමට මදුරාසියෙන් ගෙන්වන ලද නිලධාරීන්

B. වෙළෙඳ සමාගමේ පාලනයට විරුද්ධව ඇති වූ කැරැල්ල පිළිබඳ සොයා බැලීමට පැමිණි කොමිසම (ලකුණු 02)

II) උඩරට රාජධානිය තුළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා මහජනතාව අතර අර්බුද ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III) උඩරට රාජ්‍යය යටත් කර ගැනීමේ දී ඉංග්‍රීසීන් අනුගමනය කළ උපායශීලී ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07)

I) ඉන්දියාවේ ප්‍රදේශ ඈඳා ගැනීමේ දී ඉංග්‍රීසීන් ගෙන ගිය ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

II) ඉන්දියානු ජාතික සංගමයේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

III) ඉන්දියාවේ නිදහස උදෙසා මහත්මා ගාන්ධිතුමා ගෙන ගිය සටන් උපක්‍රම තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

**මතුගම අධ්‍යාපන කලාපය**

# දෙවන වාර ඇගයීම - 2023

| 9 ශ්‍රේණිය | විෂයය – ඉතිහාසය | පිළිතුරු |
|---|---|---|

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | I | 06. | I | 11. | I | 16. | I |
| 02. | II | 07. | I | 12. | I | 17. | I |
| 03. | I | 08. | III | 13. | II | 18. | II |
| 04. | I | 09. | I | 14. | IV | 19. | I |
| 05. | IV | 10. | III | 15. | II | 20. | II |

## II කොටස

01. I. I) C - කැලිකට්

II) D - ගෝව

III) A - පොන්ඩිචේරි

IV) B - සූරාට්

II. A - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා

B - පරම විඥානාර්ථ සමාගම

C - ඇමරිකාව

D - බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීම. / ඉරුදි දහම් පාසල් ඇරඹීම. / වෙසක් පොහොය රජයේ නිවාඩු දවසක් කිරීම.

II. A - ආර්මුග නාවලර්තුමා

B - ඩී.එස්. සේනානායක මහතා

C - පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

D - එම්.සී. සිද්දිලෙබ්බේ මහතා

02. I) a) ෆන් එංගල්බෙග්

b) රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා

II) * ඉංග්‍රීසි වෙළඳ සමාගම පැනවූ නව බදු

* බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර්වරු පත් කිරීම.

* මුදලින් බදු ගෙවීමට සිදුවීම.

III) * රජෙක් නොමැති වීම නිසා ජනතාව තුළ වූ කලකිරීම.

* බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදු දහම විනාශ වෙතැයි බියවීම.

* දේශීය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් නොසලකා හැරීම.

* රදළ ප්‍රධානීන්ගේ වරප්‍රසාද අහිමි වීම.

* වෙල්ලස්සේ වඩිගේ මුහන්දිරම් තනතුරට මුස්ලිම් ජාතිකයක් පත් කිරීම.

මින් කරුණු 3ක් විස්තර කර තිබිය යුතු ය.

03. I) බද්දේගම වාදය / වරාගොඩ වාදය / උදන්විට වාදය / ගම්පොළ වාදය / පානදුරා වාදය

II) * පිරිවෙන් පිහිටුවීම. * මුද්‍රණාල පිහිටුවීම.

* වාද විවාද පැවැත්වීම. * බෞද්ධ පාසල් පිහිටුවීම

III) 1. පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි - මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙණ පිහිටුවීම.

2. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා - බෞද්ධ පාසල් පිහිටුවීම.

3. අනගාරික ධර්මපාලතුමා - දේශීය සංස්කෘතිය රැක ගැනීමට ක්‍රියා කිරීම.

04. I) ලන්ඩන් මිෂනාරි සමාගම / බැප්ටිස්ට් මිෂනාරි සමාගම / වෙස්ලියන් මිෂනාරි සමාගම

ඇමරිකන් මිෂනාරි සමාගම / චර්ච් මිෂනාරි සමාගම

II) * ලේඛන හා දේශන මාධ්‍ය යොදා ගැනීම.

උදා - මාසික තැග්ග, උරගල, ලංකා නිධානය

* සමාජ සේවා කටයුතු සිදු කිරීම.

III) * සිංහල හා දෙමළ භාෂා ඉගෙන ගත් මිෂනාරිවරු ගම්බද පාසල්වල දේශීය භාෂාවෙනුත් නගරබද පාසල්වල ඉංග්‍රීසි භාෂාවෙනුත් අධ්‍යාපන කටයුතු මෙහෙය වීම.

* බ්‍රිතාන්‍ය පාලන සමයේ දී රජයේ තනතුරු ලබා ගැනීමට ඉංග්‍රීසි භාෂාව අවශ්‍ය බව දැන්වීම.

* මිෂනාරීන් ලංකාවේ විවිධ ප්‍රදේශ බෙදා ගෙන අධ්‍යාපන කටයුතු පවත්වාගෙන යාම.

ඉහත කරුණු විස්තර කර තිබීම අවශ්‍ය වේ.

05. I) හෙන්රිවෝඩ් / හර්කියුලිස් රොබින්සන් / විලියම් ග්‍රෙහරි / ආතර් ගෝඩන්

II) * තේ වගාවට වඩාත් උචිත පරිසරයක් මෙරට තෙත් කලාපයේ පැවතීම.

* ශ්‍රී ලංකාවේ තේ සඳහා ලන්ඩන් හා ලෝක වෙළඳපොළ හොඳ ඉල්ලුමක් තිබීම.

* ලාභදායී ලෙස ශ්‍රමය ලබාගත හැකිවීම.

* දුම්රිය හා මහාමාර්ග පහසුකම් වැඩි දියුණු වීම.

* නිෂ්පාදන වියදම අඩුවීම.

III) * යහපත් - දුම්රිය හා මහාමාර්ග පහසුකම් දියුණුවීම.

* අයහපත් - ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම.

මෙම කරුණු විස්තර කර තිබීම අවශ්‍යය.

06. I) A - අවුම්ල්දාර්වරු B - දමියුරන් කොමිසම

II) * රජු හා මහජනතාව අතර ඇති වූ දුරස්ථභාවය

* ශ්‍රී වික්‍රමරාජසිංහ රජු මත්පැන් පානය පෙළඹීම.

* ඇහැලේපොළ පවුල ඝාතනය කිරීම.

* භික්ෂූන් වහන්සේලා ඝාතනය කරරවීම.

III) * උඩරට රාජධානිය තුළ එවකට පැවති අභ්‍යන්තර භේද පුළුල් වන ලෙස කටයුතු කිරීම.

* රාජධානිය තුළ සිදුවන සියලු තොරතුරු රහසිගතව රැස් කිරීම.

* ජෝන් ඩොයිලි නම් දක්ෂ නිලධාරියකු යෙදවීය.

07. I) * උපකාරක ගිවිසුම් ක්‍රමය හා අස්වාමික න්‍යාය යන ප්‍රතිපත්ති යොදා ගැනීම.

* බෙංගාලය හා අවට ප්‍රදේශ අතර පැවති අසමගිතා හා බල අරගලවලින් ඉංග්‍රීසීන් ප්‍රයෝජන ගැනීම.

II) * සියලූ ඉන්දියානුවන් තුළ මිත්‍රත්වය හා සහයෝගීත්වය වර්ධනයට කටයුතු කිරීම.

* කුලය, ආගම, වර්ගය හා ප්‍රදේශ ආදී භේද නොසලකා ඉන්දියානුවන් තුළ ජාතික හැඟීම් දියුණු කිරීමට ක්‍රියා කිරීම.

* ඉන්දියානු උගතුන් තුළ පවතින අදහස් හා යෝජනා එක් රැස්කොට සමාජ ගැටලු අධ්‍යයනයට කටයුතු කිරීම.

III) * අවිහිංසාවාදී සටන් ව්‍යාපාරයක් ගෙනයාම.

උදා - චම්පරන් ව්‍යාපාරය, ඛේඩා ව්‍යාපාරය

* සත්‍යාග්‍රහය, රජයට සහය නොදැක්වීම, සිවිල් නීති කඩ කිරීම, පාගමන්වල යාම, උපවාස කිරීම වැනි අවිහිංසාවාදී සටන් උපක්‍රම රැසක් ගාන්ධිතුමා ක්‍රියාත්මක කිරීම.

* ඉන්දියාවේ සිටි ධනවත් පිරිසට මෙන්ම දුප්පත් ගොඩි කම්කරු ජනතාවට ද ඉතා පහසුවෙන් මෙම සටන්වලට සම්බන්ධ වීමේ හැකියාව ලැබීම.

ඉහත කරුණු ඇතුලත්ව විස්තරයට ලකුණු දෙන්න.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න